**ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව - 2020**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමණාකාරිත්වය කොමිෂන් සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කොමිෂන් සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත්

ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කොමිෂන් සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 දෙසැම්බර් 31 දින වන විට වාර්ෂික නියාමන ගාස්තු වශයෙන් 2014/15 වර්ෂයේ සිට ලංකා විදුලිබල මණ්ඩලයෙන් රු. 81,852,700 ක් ද, අනෙකුත් ආයතන වලින් රු. 1,051,721 ක් ලැබිය යුතුව තිබුණි. 2021 ජුනි 30 වන දින වන විට වෙනත් ආයතන වලින් රු. 726,954 ක් පමණක් අය කර ගෙන තිබුණු අතර ලංකා විදුලිබල මණ්ඩලයෙන් අයකර ගත යුතුව තිබුණු රු. 81,852,700 ක් අයකර ගැනීමට අපොහොසත් වි තිබුණි. | 2021/12/23 රැස්වූ විගණන හා කළමනාකරණ කමිටුවේ යෝජනාව වූයේ බොල් ණය ලෙස කපා හැරීමට ප්‍රථම කොමිෂන් සභාව සියළු උත්සාහයන් දැරිය යුතු නිසා නීතිමය ක්‍රියාමාර්ගයක් ගැනීමේ හැකියාව සලකා බලන ලෙසය. මෙකී යෝජනාව කොමිෂන් සභාවට ඉදිරිපත් කර ඉදිරියේදී කටයුතු කරනු ඇත.<br><br>අනෙකුත් ආයතනවලින් ලැබිය යුතු රු.1,051,720 ක මුදලින් මේ වන විට රු.726,954ක් එකතු කරගෙන ඇත. ඉතිරිය 2021 දෙසැම්බර් 31 දිනට ප්‍රථම ගෙවන ලෙස දන්වා සිහිකැඳවීම් යවා ඇත. | ලැබිය යුතු ශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

## 1.6 නීති, රීති, රෙගුලාසි, කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2018 ජුලි 18 දිනැති අංක 03/2018 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ I හා II ඡේද | ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ සංවිධාන ව්‍යුහය හා වැටුප් ව්‍යුහය ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන මුදල් ඇමතිතුමා විසින් අමාත්‍ය මණ්ඩලය වෙත | ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව ස්ථාපිත කිරීමේ පනත අනුව එහි ස්වාධීනත්වය තහවුරු කිරීම සඳහා පනතේ පහත සඳහන් වගන්ති ඇතුළත් කර ඇත. | පිළියෙල කර ඇති ආයතන පරිපාලන හා කාර්ය පටිපාටි සංග්‍රහය භාණ්ඩාගාරය වෙත යොමු කර ඒ සඳහා අනුමැතිය ලබා ගත යුතු වීම |

සංදේශයක් ඉදිරිපත් කර අනුමත කරගත යුතුව තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටද එම කටයුතු සිදු නොකර පහත පරිදි වියදම් කර තිබුණි.

(i) ආයතනයේ කාර්ය මණ්ඩලය වෙත දීමනා වර්ග 10 ක් යටතේ එකතුව රු.42,795,220 ක් ගෙවා තිබුණි.

(ii) සහකාර අධ්‍යක්ෂ තනතුර සඳහා මාසිකව රු.40,000 ක් බැගින්ද, කළමනාකරණ තනතුර සඳහා මාසිකව රු. 5,000 ක් බැගින්ද, රියදුරු තනතුර සඳහා මාසිකව රු.2,500 ක් බැගින්ද, ගමන් වියදම් ලෙස ගෙවීමට මහජන උපයෝගීතා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටි සංග්‍රහය අනුව විධිවිධාන සලසා තිබුණි. එම විධිවිධානවලට භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා නොගෙන එකතුව රු.8,511,832 ක් ගෙවා තිබුණි.

(iii) කොමිෂන් සභාවේ සේවයේ නියුතු ස්ථිර සේවකයන් සඳහා උපරිමය රු. මිලියන 5 ක සහ ආපසු ගෙවීමේ කාලය අවුරුදු 5 යටත්ව වාහන සඳහා ණය යෝජනා ක්‍රමයක් අනුමත කර තිබුණි. එම යෝජනා ක්‍රමය සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. ඒ අනුව බැංකුවකින් අයකර ගනු ලබන පොලී ප්‍රතිශතයෙන් සියයට 4.25 ක් සේවකයාගෙන් අයකර ගනු ලබන අතර බැංකුව අයකරන

**12 වගන්තිය**

කොමිෂන් සභාවේ නිලධාරීන් සඳහා දීමනා හා පහසුකම් ලබාදීමේ බලය කොමිෂන් සභාවට ලබාදීම.

**39 වගන්තිය**

" මේ පනත නොවන යම් අදාළ පනතක මේ පනතේ විධිවිධානවලට අනුකූල කවර විධිවිධානයක් අන්තර්ගතව තිබුණ ද මේ පනතේ විධිවිධාන සහ මේ පනත යටතේ සාදන නියෝග රීති හෝ නියමයන් බලපැවැත්විය යුතුය." ඒ අනුව කෙටුම්පත් වාර්තාවේ සඳහන් විගණන ඡේද අංක (i) (ii) (iii) (iv) සඳහා පහත සඳහන් පිළිතුර ඉදිරිපත් කරමි.

(අ) ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනතේ 12(3) වගන්තිය අනුව එහි 12(1) වගන්තියේ සඳහන් කාරණය සම්බන්ධව රීති සෑදීමට බලය ලබාදී තිබීම.

(ආ) 2005 මාර්තු 14 දිනැතිව ජනාධිපති ලේකම්තුමා විසින් මෙම කොමිෂන් සභාවේ සභාපතිතුමා වෙත එවා තිබෙන අංකය DMD/03 දරන ලිපියෙන් ද තහවුරු කර තිබීම.

(ඇ) ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ සභාපතිතුමා විසින් ඔහුගේ අංකය PUC/SEC/3 2006 ජූලි 31 දින රාජ්‍ය ව්‍යාපාර

පොලී ප්‍රතිශතය හා සියයට 4.25 අතර වෙනස කොමිෂන් සභාව විසින් බැංකුවට ප්‍රතිපූර්ණය කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී නිලධාරීන් 04 දෙනෙකු විසින් ලබාගෙන තිබූ වාහන ණය වෙනුවෙන් පොලිය ලෙස රු.187,013 කොමිෂන් සභාව විසින් බැංකුවට ප්‍රතිපූර්ණය කර තිබුණි.

(iv) කොමිෂන් සභාවේ ස්ථිර සේවකයන් සඳහා රු. මිලියන 8 ක උපරිම සීමාව හා අවුරුදු 15 ක කාල සීමාවට යටත්ව නිවාස හා දේපල ණය යෝජනා ක්‍රමය 2018 අගෝස්තු 18 දිනැති අංක 220 දරන කොමිෂන් සභා පත්‍රිකාව මඟින් අනුමැතිය ලබා දී තිබුණි. ඒ සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. ඒ අනුව සේවකයන් විසින් රජය සතු බැංකුවකින් ලබා ගන්නා ලද නිවාස හා දේපල ණය සඳහා අයකරනු ලබන පොලියෙන් සියයට 4.25 ක් සේවකයා විසින් දැරිය යුතු අතර, බැංකුව අයකරනු ලබන පොලිය හා සියයට 4.25 ක් අතර වෙනස කොමිෂන් සභාව විසින් බැංකුවට ප්‍රතිපූර්ණය කරනු ලබයි. මේ අනුව සමාලෝචිත වර්ෂය තුළ නිලධාරීන් 17 දෙනෙකු විසින් ලබා ගන්නා ලද නිවාස හා දේපල ණය වෙනුවෙන් පොලිය ලෙස එකතුව රු.2,395,761 ක් කොමිෂන් සභාව විසින් බැංකුවට ප්‍රතිපූර්ණය කර තිබුණි.

දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ටද පිටපත් සහිතව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ලිපියක් යොමු කර ඇත.

| | | | |
|---|---|---|---|
| (ආ) | 2016 ඔක්තෝබර් 27 දිනැති අංක | චක්‍රලේඛයේ විධිවිධාන පරිදි ප්‍රවාහන දීමනා හිමි නිලධාරීන්ට ප්‍රවාහන දීමනාව | ශ්‍රී ලංකා මහජන උපයෝගිතා පිළියෙල කර ඇති කොමිෂන් සභා පනතෙහි 12 (3) ආයතන පරිපාලන වගන්තිය අනුව රීති සෑදීමට හා කාර්ය පටිපාටි |

| | | | | |
|---|---|---|---|---|
| | PED/1/2015 (i) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | ලෙස රු.50,000 ක මාසික දීමනාවක් ලබාදිය හැකි වුවත්, කොමිෂන් සභාවේ කාර්ය පටිපාටි සංග්‍රහය යටතේ එම චක්‍රලේඛ විධිවිධාන අභිබවා ප්‍රවාහන දීමනා ලෙස රු.60,000 ක් හා රියදුරු දීමනා ලෙස රු.20,000 ක් බැගින් ගෙවීම් කර තිබුණි. එම විධිවිධාන සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා නොගෙන එකතුව රු.13,140,000 ක් ගෙවා තිබුණි. | ලබාදී තිබෙන බලය අනුව කොමිෂන් සභාවේ කාර්ය පටිපාටි සංග්‍රහය සකස් කර ඇත. එහි ප්‍රතිපාදන මත මෙම ගෙවීම් කර ඇත. | සංග්‍රහය භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගත යුතු වීම |
| (ඇ) | 2015 මැයි 25 දිනැති අංක PED - 1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 3.1 ඡේදය | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව නිල වාහන හිමි නිලධාරීන්ට ගෙවිය යුතු ඉන්ධන ලීටර් ප්‍රමාණයට අදාල වටිනාකම ඉක්මවා කොමිෂන් සභාවේ අනුමැතිය මත ඉන්ධන දීමනා ගෙවා තිබුණි. | කොමිෂන් සභාව විසින් අනුමත කළ මූල්‍ය උපදෙස් සංග්‍රහය, මානව සම්පත් හා පරිපාලන රීති සංග්‍රහය (Financial Manual, Human Resource and Administration Procedure Manual) මත මෙම ගෙවීම් සිදුකර ඇති බව සඳහන් කරමි. | පිළියෙල කර ඇති ආයතන පරිපාලන හා කාර්ය පටිපාටි සංග්‍රහය භාණ්ඩාගාරයට ඉදිරිපත් කර අනුමත කර ගැනීමට කටයුතු කළ යුතු වීම |
| (ඈ) | ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ මූල්‍ය කාර්ය පටිපාටි සංග්‍රහය | කිසියම් විශේෂිත කාර්යයක් සඳහා මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට පමණක් එක් අවස්ථාවකදී ලබාදෙන රු.20,000 ක උපරිමය යටතේ වූ තත්කාර්ය අතුරු අග්‍රිමය අදාල විශේෂිත කාර්යයට ආසන්නතම දිනයකදී නිලධාරියා වෙත ලබාදිය යුතු අතර නිලධාරියා විසින් එම කාර්යය අවසන් කර දින 2 ක් හෝ දින 3ක් තුළ පියවිය යුතුව තිබුණි. නමුත් ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව විසින් නිකුත් කර තිබුණු තත්කාර්ය අතුරු අග්‍රිම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව විසින් අනුමත කර තිබෙන මූල්‍ය කාර්ය පටිපාටි සංග්‍රහයේ 12.8.3 වගන්තිය අනුව අනුමත එක් වැඩසටහනක් සඳහා අවශ්‍ය අත්තිකාරම් මුදල තීරණය කර නොමැති බව කාරුණිකව දන්වා සිටිමි.<br><br>2020 වර්ෂයේ රටේ උද්ගත වූ ව්‍යසනකාරී තත්වය, බස්නාහිර පළාත දිගු කාලයක් වසා දැමීම යන හේතු මත මෙහි (ඊ සිට (වී) දක්වා වූ අඩුපාඩු ලේඛන වල සිදුවී ඇතත් අදාළ වැඩසටහන නිමවූ විගස ලබාදී තිබෙන අත්තිකාරම් මුදලින් වියදම් නොවූ මුදල ආයතනයට බැර කිරීම නිසා ආයතනයේ මුදල් අවභාවිතයක් සිදුවී නොමැති බව දන්වා සිටිමි. තවදුරටත් අසා තිබෙන විමසුම් සඳහා පහත සඳහන් පිළිතුර යොමුකර ඇත. | වියදම් නොවූ ඉතිරි මුදල මුදලින් හා වියදම් කළ මුදල සඳහා ගෙවීම් සාක්ෂි සමඟ වියදම පියවීම කළ යුතු වීම<br><br>තත්කාර්ය අතුරු අග්‍රිම ගෙවූ කාර්ය නිමවූ වහාම එම අත්තිකාරම් පියවීම කළ යුතු වීම |

| | | |
|---|---|---|
| (i) නිලධාරීන් විසින් ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිම දින 43 ක සිට දින 326 ක් දක්වා පරාසයක කාල ප්‍රමාදයකින් පසු පියවා තිබුණි. | (i) වැඩසටහන නිමවූ විගස ඒ සඳහා වියදම් වී නොමැති ඉතිරි මුදල් ආයතනයට ගෙවා තිබීම. | තත්කාර්ය අතුරු අග්‍රිම පියවීම විධිමත් පරිදි සිදු කළ යුතු වීම |
| (ii) නිලධාරීන් විසින් ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිම වලින් එකතුව රු.46,500 ක් වියදම් කර නොතිබුණත්, එම මුදල් 2020 දෙසැම්බර් 31 දින වන විටත් පියවීම් කටයුතු නොකර අත රඳවාගෙන තිබුණි. | (ii) අත්තිකාරම් පියවීමේ වවුචර් ඉදිරිපත් කිරීමේදී එහි අන්තර්ගත වියදම් සඳහා ඉදිරිපත් කරන පියවීමේ වවුචර් පරික්ෂා කිරීමේදී ඉදිරිපත් කල ඇතැම් ලදුපත් මතභේදාත්මක වන අවස්ථා වලදී ඒවාට අවසර නොදී ගිණුම් අංශයෙන් අත්තිකාරම් පියවීමට කටයුතු කරන බැවින් මෙම අඩුවෙන් පියවීම් දක්නට ලැබේ. මෙම අඩුවෙන් පියවීම් ඔවුන් විසින් ම වැඩියෙන් පියවා තිබෙන මුදල් වලින් පසුව හිලව් කර ඇත. නමුත් එවැනි හිලව් කිරීම් 2022 දී සිදු නොකිරීමට නිලධාරීන්ට උපදෙස් දී ඇත. | තත්කාර්ය අතුරු අග්‍රිම ලබාදීම ක්‍රමවත් කළ යුතු වීම.<br>තත්කාර්ය අතුරු අග්‍රිම ලබාදීම ක්‍රමවත් කළ යුතු වීම |
| (iii) නිලධාරීන් විසින් ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිම වියදම් නොකර නැවත පියවිය යුතු මුදලට වඩා වැඩියෙන් පියවා තිබීම නිසා 2020 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු තත්කාර්ය අතුරු අග්‍රිම ශේෂය රු.92,769 ක් වී තිබුණි. | (iii) අදාළ වැඩ සටහන නිම කළ විගස නිලධාරීන් විසින් ඔවුන්ගේ අත ඉතිරි මුදල් පියවනු ලැබේ. නමුත් ඔවුන් අත්තිකාරම් පියවීමේදී පියවීම් වවුචරය සමඟ ඉදිරිපත් කරන වියදම් ගණනය කළ විට කලින් තක්සේරු කළ වියදමට වඩා වියදම් වූ මුදල වැඩි වේ. එවැනි අවස්ථාවල වැඩියෙන් පියවීම් දක්නට ලැබේ. මෙම වැඩියෙන් පියවීම් ඔවුන් විසින් කලින් දක්වා තිබෙන අඩුවෙන් පියවීම සඳහා පසුව ගලපා ඇත. | තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම හා පියවීම නිවැරදි ලෙස ලේඛනගත කළ යුතු වීම<br>තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම හා පියවීම ක්‍රමවත් ලෙස කළ යුතු වීම. |

| | |
|---|---|
| (iv) එකම නිලධාරියා විසින් එකම වැඩසටහන් සඳහා එකම දින එකතුව රු.309,770 ක් වවුචර් කිහිපයක් මගින් තත්කාර්ය අතුරු අග්‍රිම ලබාගෙන තිබුණි. | (iv) මෙලෙස සිදු වී ඇත්තේ එක් අවස්ථාවකදී පමණි. එය හඳුනාගත් වහාම නතර කර ඇත. ඉන් අනතුරුව සිදු වී නොමැත. |
| (v) එකම නිලධාරියාට එකම දින, ආසන්නතම දිනවල තත්කාර්ය අතුරු අග්‍රිම ලබාදීම හා කලින් දී තිබූ අතුරු අග්‍රිම පියවීමට ප්‍රථම නැවත අතුරු අග්‍රිම ලබාදී තිබුණු අවස්ථා පැවතුණි. | (v) ආයතනයේ සිටින සීමිත නිලධාරි මණ්ඩලය ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් අනුමත වැඩසටහන් සඳහා අඛණ්ඩව යෙදවීමට සිදුවීම හේතුවෙන් වැඩසටහන් කිහිපයකට එක් දිනයකදි අත්තිකාරම් ලබා දීමට සිදුවන නමුත් එය 2022 සිට සිදු නොකිරීමට කටයුතු යොදා ඇත. |
| (vi) තත්කාර්ය අතුරු අග්‍රිම වශයෙන් නිකුත් කර තිබුණු රු.115,495 ක් අත්තිකාරම් ලේඛනයේ දෙවරක් සටහන් කර තිබුණි. | (vi) මෙම දෝෂය හඳුනාගත් වහාම නිවැරදි කර ඇත |
| (vii) නිකුත් කර තිබුණු තත්ත්කාර්ය අතුරු අග්‍රිම වෙනුවෙන් පිළියෙල කර තිබූ වවුචර්වල අංකය හා දින අනුපිළිවෙලට අත්තිකාරම් ලේඛනයේ සටහන් කර නොතිබුණි. | (vii) අත්තිකාරම් ලේඛනය 2021 සිට යාවත්කාලීනව පවත්වාගෙන යනු ලැබේ. කෙසේ වෙතත් වැඩසටහන් සඳහා අත්තිකාරම් ගෙවීම හා එහි පාලනය තවදුරටත් ක්‍රමවත් විය යුතු බැවින් ඒ සඳහා අදාළ මූල්‍ය කාර්ය පටිපාටි සංශෝධනය කිරීමට නව ක්‍රියාපටිපාටියක් සකස් කර එහි කෙටුම්පත කළමනාකාරීත්වයට ඉදිරිපත් කර ඔවුන් සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව කෙටුම්පත |

| | | | | |
|---|---|---|---|---|
| | | | කොමිෂන් සභාවේ අනුමැතියට ඉදිරිපත් කිරීමට කටයුතු යොදා ඇත. | |
| (ඉ) | 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනත මගින් විදුලිය, ඛනිජතෙල් හා ජලය නියාමනය කිරීම. | විදුලිය, ඛනිජතෙල් හා ජලය යන ශ්‍රී ලංකාවේ යටිතල පහසුකම් කර්මාන්ත නියාමනය කිරීම සඳහා 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභා පනතෙන් ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාවට බලය ලැබී තිබුණි. ඛනිජතෙල් කර්මාන්තය හා ජලසම්පාදන හා ජලාපවාහන කර්මාන්තය අධීක්ෂණය කිරීම සඳහා අවශ්‍ය නීතිමය රාමුව සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සකස් කර නොතිබුණි. | අවශ්‍ය නීතිමය රාමුව සකස් කර ගැනීම සඳහා පහත සඳහන් ක්‍රියාමාර්ග ගෙන තිබෙන බව කාරුණිකව දන්වමි.<br><br>• 2017 ජල කර්මාන්ත අමාත්‍යාංශය මගින් අනුමැතිය ලබාගැනීම හා අදාළ කෙටුම්පත සකස් කිරීම සඳහා ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අතිරේක ලේකම් (සංවර්ධන) ගේ සහභාගිත්වය ඇතිව නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව, ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව ඇතුළත් අනු කමිටුවක් පත්කර කෙටුම්පතක් සකස් කර 2019 මාර්තු 27 දින නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව මගින් නීතිපති වෙත යොමු කර තිබීම.<br><br>• 2002 අංක 32 දරන ඛනිජ තෙල් නිෂ්පාදන (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීමේ කෙටුම්පත සකස් කර නීතිපති දෙපාර්තමේන්තුව වෙත 2012 දී ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීම හා ඛනිජතෙල් විෂයභාර අමාත්‍යාංශය වෙත භාර දී ඇති අතර එම කෙටුම්පත පාර්ලිමේන්තුගත කිරීමට අමාත්‍යාංශය මේ දක්වා කටයුතු කර නොමැත. | ඛනිජතෙල් හා ජලය නියාමනය කිරීමට අදාළ නීතිමය රාමුව සකස් කර ගැනීමට කටයුතු කළ යුතු වීම |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 146,775,974 අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 99,358,522 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 47,417,452 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට වෙනත් ආදායම් සියයට 11 කින් වර්ධනය වීම සහ උපදේශන සේවා වියදම් හා මෙහෙයුම් වියදම් පිළිවෙලින් සියයට 81 කින් හා සියයට 22 කින් අඩුවීම හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 2016 පෙබරවාරි 12 දිනැති අංක PUCSL/2016/183/FIN/02 දරන කොමිෂන් සභා පත්‍රිකාව හා 2016 පෙබරවාරි 18 දිනැති කොමිෂන් සභා තීරණය අනුව ලංකා විදුලිබල මණ්ඩලයට ගෙවිය යුතු ආරක්ෂක තැන්පතු මුදල රු. 10,552,559 ක් ආපසු ගෙවීමට අනුමැතිය දී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී ඒ සඳහා රු.47,441 ක් වැඩියෙන්, රු. 10,600,000 ක් නිරවුල් කර තිබුණි. | 2016 පෙබරවාරි 18 දිනැති කොමිෂන් සභා තීරණය අනුව ආරක්ෂිත ඇප ලෙස තැන්පත් කර තිබෙන රු.10,000,000 කි. ඉතිරිය ඒ සඳහා බැරකල පොළිය වේ. ඒ අනුව ඉතිරි රු. 552, 559 ක මුදල 2018 දක්වා ගණන් බලා තිබෙන පොළිය වේ. නමුත් මෙම මුදල 2021 ආපසු ගෙවීමේදී එයට සාධාරන පොලියක් සමඟ මුදල ආපසු ගෙවිය යුතු වේ. ඒ පදනමින් රු. 10,600,000 ක මුදල ගෙවා ඇත. වැඩිපුර මුදල් ගෙවීමක් නොමැති බව දන්වා සිටිමි. | නියමිත කාලපරිච්ඡේදය තුළ දී ගෙවීම් සිදුකර, ඇති විය හැකි අලාභ අවම කර ගැනිමට කටයුතු කළ යුතු වීම. |
| (ii) | ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ වාර්ෂික අයවැය ඇස්තමේන්තුව සකස් කිරීමේදී වියදම ඇස්තමේන්තු කර තිබුණද ආදායම් ඇස්තමේන්තුවක් සකස් කර නොතිබුණි. | 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනතේ 33 (2) වගන්තිය අනුව කොමිෂන් සභාව විසින් ඉදිරි වර්ෂය සඳහා වැය ඇස්තමේන්තු සකස් කර සැප්තැම්බර් 30 දිනට ප්‍රථම ගැසට් පත්‍රයේ පළ කිරීමට සැලැස්විය යුතුය. ඒ අනුව කටයුතු ඉටු කර ඇත. | ආදායම ඇස්තමේන්තු සකස් කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (iii) | මහජන දැනුවත් කිරිමේ වැඩසටහන් පිළිබඳ වූ පුවත්පත් දැන්වීම් පලකිරීම සඳහා රු. 693,036 ක් වැය කර තිබුණත්, ඒ සඳහා වන ලිපිගොනුව විධිමත් පරිදි යාවත්කාලීන කර නොතිබුණි. | 2021 වර්ෂයේ සිට එක් එක් වැඩසටහන සඳහා වෙන වෙනම ලිපිගොනු පවත්වාගෙන යන ලෙසත් ඒවා යාවත්කාලීනව පවත්වාගෙන යන ලෙසත් උපදෙස් ලබා දී එම තත්ත්වය නිවැරදි කර ඇත. | ලිපිගොනු විධිමත්ව යාවත්කාලීන කළ යුතු වීම. |

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 46 වන වගන්තියට අනුව, වාර්ෂික නියාමන බද්දක් /ගාස්තුවක් පැනවීමට කොමිෂන් සභාවට බලය ලබා දී තිබුණි. එය, සෑම වර්ෂයකම ජුනි 30 දින හෝ ඊට පෙර සෑම බලපත්‍රයකින්ම අය කරගත යුතුව තිබුණි. 2020 වර්ෂය සඳහා වූ වාර්ෂික නියාමන ගාස්තු බලපත්‍රලාභීන් 82 දෙනෙකුගෙන් නියමිත දින හෝ ඊට පෙර අය කර ගෙන නොතිබුණි. එය වාර්ෂික නියාමන ගාස්තු අය කළ යුතු බලපත්‍රලාභීන්ගෙන් සියයට 44 ක් නියෝජනයක් වී තිබුණි. | පනතේ නියමයන් අනුව වාර්ෂික නියාමන ගාස්තු සෑම වර්ෂයකම ජුනි 30 හෝ ඊට පෙර අයකර ගත යුතුව ඇත .නමුත් අදාල බලපත්‍ර ගාස්තු ගෙවන ලෙස දන්වා බලපත්‍රලාභීන් වෙත ලිපි හා සිහිකැඳවීම් නිරන්තරයෙන් යවනු ලැබේ. එහෙත් නියමිත දිනට මුදල් ගෙවනුයේ සුළු පිරිසක් විසිනි. කෙසේ වෙතත් අදාළ මුදල් වර්ෂය තුළ මුදල් අයකර ගැනීමට ආයතනය විසින් උපරිම උත්සාහයක් ගන්නා බව පෙන්වා දෙමි. | ආදායම් හා ගාස්තු නියමිත දිනට එකතු කරගැනීමට කටයුතු කළ යුතු වීම. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (i) | සමාලෝචිත වර්ෂය අවසාන වනවිට විදුලිය බෙදා හැරීමේ සංග්‍රහය සංශෝධනය කර නොතිබුණි. | බලපත්‍ර කළමනාකරණ පද්ධතියේ කාර්යය නිම කිරීම සඳහා 2021 වර්ෂයේදී ප්‍රසම්පාදන කටයුතු නිමකොට කාර්යය නිම කිරීමට බාර දී ඇත. | සැලසුම් කළ පරිදි කාර්යයන් ඉටුකිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතු වීම |
| (ii) | බලපත්‍ර කළමනාකරණ පද්ධතියේ කාර්ය නිමකිරීම් සහ සමාලෝචිත වර්ෂයට අදාළ පර්යේෂණ ක්‍රියාකාරකම් විගණිත දිනය වනවිටත් අවසන්ව නොතිබුණි. | රටේ පැවැති වාතාවරණය අනුව මෙම ක්‍රියාකාරකම ඉටු කිරීම තාවකාලිකව නතරකර බලපත්‍රලාභීන් සම්බන්ධව ක්‍රියාකාරකම් සඳහා මූලිකත්වය ලබා දී ඇත. | සැලසුම් කළ පරිදි කාර්යයන් ඉටුකිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතු වීම |

| | | | |
|---|---|---|---|
| (iii) | ශ්‍රී ලංකාවේ අඩු ආදායම්ලාභී පවුල් සඳහා බලශක්ති කාර්යක්ෂම නිවාස ආකෘතියක් හඳුන්වාදීම, දැනුවත් කිරීම සහ ප්‍රවර්ධනය කිරීම - UOM සමඟ පර්යේෂණ ප්‍රදාන සහ දැනුම බෙදාගැනීමේ ව්‍යාපෘතිය ස්ථාපිත කර තිබුණද, ඒ සම්බන්ධ ඉලක්ක ඉටු කරගැනීමට කොමිෂන් සභාව අපොහොසත් වී තිබුණි. | මේ සම්බන්ධව න්‍යායාත්මක කරුණු හා ප්‍රායෝගික කරුණු ඇතුළත් පර්යේෂණ වාර්තාව 2020 වර්ෂය තුළ ආයතනයට ලබාදී ඇති නමුත් 2020 කොවිඩ් 19 වසංගත ව්‍යාප්තිය හේතුවෙන් අඩු ආදායම්ලාභී පවුල් වෙත ගොස් බලශක්තිය කාර්යක්ෂම ලෙස පාවිච්චි කිරීම පිළිබඳ දැනුවත් කිරීමේ ක්‍රියාවලිය ඉටු කිරීමට නොහැකි වී ඇත. | සැලසුම් කළ පරිදි කාර්යයන් ඉටුකිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතු වීම |
| (iv) | ශ්‍රී ලංකාවේ රජයේ ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කිරීම සඳහා සාම්පල ගොඩනැඟිලි ආකෘතිය සහ මාර්ගෝපදේශ හඳුන්වාදීම සහ ප්‍රවර්ධනය කිරීම යන කාර්යය කොමිෂන් සභාව විසින් ළඟා කරගෙන නොතිබුණි. | මොරටුව විශ්වවිද්‍යාලය විසින් ආදර්ශ ගොඩනැගිලි ආකෘති හා සම්බන්ධව තොරතුරු හා දත්ත එක් රැස්කර අදාළ මූලික ක්‍රියාවලිය ඉටු කර ඇතත් පර්යේෂණය අවසන් අදියර කොවිඩ් 19 වසංගත තත්ත්වය මත ඉටු කිරීමට නොහැකි වී ඇත. | සැලසුම්වලට අනුකූලව කටයුතු කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතු වීම. |
| (v) | ධාරිතා සංවර්ධනය හා පුහුණුව සම්බන්ධව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා රු. මිලියන 6ක ප්‍රතිපාදන සලසා තිබුණද, කොවිඩ් - 19 සහ ඒ ආශ්‍රිත දුරස්ථ රෙගුලාසි හේතුවෙන් තෝරාගත් මාර්ගගත පුහුණුවීම් හා සමහර භෞතික පුහුණුවීම් සිදු කරනු ලැබූ අතර එම පුහුණුවීම්වල කාර්යසාධන, සමස්ථ කාර්යසාධන ප්‍රගතියේ සියයට දහයක් ලෙස නිරූපණය කරනු ලැබීය. | පහත සඳහන් හේතු මත සැලසුම් කළ ආකාරයට නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධන කටයුතු ඉටු කිරීමට නොහැකි වී ඇත.<br>මූලික වශයෙන් දේශීය හා විදේශීය ආයතන මගින් නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණත් කොවිඩ් 19 වසංගත තත්ත්වය මත විදේශීය ආයතන අදාල පුහුණු වැඩසටහන් ක්ර්‍රියාත්මක නොකිරීම.<br><br>නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක වන විදේශ රටවලද මෙම වසංගත තත්ත්වය පැවති නිසා එම රටවල් වෙත යෑමට ගුවන් ගමන් ක්‍රියාත්මක නොවීම. කෙසේ වෙතත් දේශීය වශයෙන් මාර්ගගත ක්‍රමයට ක්‍රියාත්මක වූ වැඩසටහන් දහයක් සඳහා නිලධාරීන් සහභාගී කර අවශ්‍ය ධාරිතා සංවර්ධන ලබාදීමට කටයුතු කර තිබෙන බව දන්වමි. | කොවිඩ් වසංගතය හේතුවෙන් විදේශ ආයතනයකින් ඉටුකර ගැනීමට නොහැකි වූ පුහුණු වැඩසටහන් වලට අදාල අරමුණු දේශීය ආයතන මඟින් ඉටුකර ගැනීම කෙරෙහි අවධානය යොමු කිරීම |
| (vi) | ජලය සහ ඛණිජතෙල් අංශ සඳහා ආපදා කළමනාකරණ සැලැසුම් සකස් | මේ සම්බන්ධව ආයතනය වශයෙන් සිදු කළ හැකි උපරිම කටයුතු සිදු කර | සැලසුම්වලට අනුකූල විය යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | කිරිම සඳහා රු. මිලියන 1.2 ක අයවැයගත ප්‍රතිපාදන සලසා තිබුණ ද, 2020 වර්ෂය අවසන් වන විටත් එම කාර්යයේ මූලික මට්ටම පමණක්, එනම් සියයට විස්සක පමණ කාර්යසාධන ප්‍රගතියක් ලඟාකර ගෙන තිබුණි. | ඉදිරි කටයුතු සඳහා අදාළ ලේඛන අමාත්‍යාංශය වෙත භාරදී ඇත. ජල සේවා කර්මාන්තය නියාමනයට අවශ්‍යව ඉටුකල කාර්යය ද ඛනිජතෙල් අංශය නියාමනය කිරීමට අවශ්‍ය නියාමන කටයුතු ද ඉදිරිපත් කර ඇත. | |
| (vii) | ලංකා විදුලිබල මණ්ඩලයේ විදුලිබල (බෙදාහැරීමේ) කාර්යසාධන ප්‍රමිති රෙගුලාසි (වාණිජමය ගුණාත්මකභාවය) ක්‍රියාත්මක කිරීම සඳහා DD2, DD3 හා DD4 හි පෝෂක පන්ති වර්ගීකරණය 2020 වර්ෂය වනවිට සම්පූර්ණ කර තිබුණු අතර ඉතිරි කාර්යයන්, කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා වාර්තා ඉදිරිපත් නොකිරීම නිසා ඉදිරියට ක්‍රියාත්මක කර නොතිබුණි. | විදුලිබල මණ්ඩලය විසින් DD2, DD3 හා DD4 යන ඡේද යටතේ වර්ගීකරණයට අදාළ විදුලිය බෙදාහැරීම පිළිබඳව වාර්තා කොමිෂන් සභාවට ඉදිරිපත් කර නොතිබීම හේතුවෙන් වාණිජමය ගුණත්වය පිළිබඳ රෙගුලාසි ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇත. නමුත් ලංකා විදුලි පුද්ගලික සමාගම මෙම තොරතුරු ලබාදීම නිසා එයට අදාළ පෝෂක පන්ති වර්ගීකරණය නිමකර ඇත. | සැලසුම්වලට අනුකූල විය යුතු වීම. |
| (viii) | පාරිභෝගික ජංගම සේවා පැවැත්වීම සඳහා රු. මිලියන 2.28 ක ප්‍රතිපාදන සලසා තිබුණත් කොවිඩ් - 19 උපදේශන හා සීමා කිරීම් නිසා එක් වැඩසටහනක් පමණක් පවත්වා තිබුණි. එය සමස්ථ කාර්යසාධනයෙන් සියයට විසිපහක් පමණක් වී තිබුණි. | 2020 වර්ෂයේදී කොවිඩ් 19 වසංගත තත්ත්වය මත රජය විසින් මහජනයා ඒකරාශී කිරීම තහනම් කිරීම මත මෙම උපදේශන කටයුතු පැවැත්වීමට නොහැකි වුවත් ලැබුණු සහනදායී කාල පදනමට 2021 වර්ෂයේ දී පහත සඳහන් පරිදි ඉතිරි පළාත් තුළ උපදේශන පවත්වන ලදී .<br><br>වයඹ පලාත 2021 මාර්තු<br>උතුරු මැද පලාත 2021 නොවැම්බර්<br>බස්නාහිර පළාත 2021 දෙසැම්බර් | සැලසුම්වලට අනුකූල විය යුතු වීම. |
| (ix) | පෙට්‍රෝලියම් නිෂ්පාදන පරීක්ෂා කිරීමට පරීක්ෂණ පහසුකම් ස්ථාපිත කිරීම වෙනුවෙන් හවුල්කාරිත්වය ගොඩනැගීම සඳහා වූ වැඩසටහන්වලට රු.මිලියනයක් ප්‍රතිපාදන සලසා තිබුණද, එහි කාර්යසාධනයේ ඵලදායී ප්‍රගතියක් 2020 වර්ෂයේදී පෙන්නුම් කර නොතිබුණි. | පෙට්‍රෝලියම් නිෂ්පාදන පරික්ෂා කිරීම සඳහා පරීක්ෂණ පහසුකම් ස්ථාපිත කිරීම සඳහා හවුල්කාරීත්ව ගොඩනැගීමේ වැඩසටහන් සඳහා අදාල පර්යේෂණාගාරය පිහිටුවීමේ කටයුතු 2020 නොවැම්බර් මස පටන්ගෙන 2021 ඔක්තෝබර් වන විට නිම කර ඇත. | සැලසුම් කළ පරිදි කාර්යයන් ඉටුකිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතු වීම |

| | | | |
|---|---|---|---|
| (x) | ලිහිසි තෙල් සම්බන්ධව දැනුවත් කිරීමේ වැඩසටහන්/ වැඩමුළුව/ වෙළඳපොල වාර්තා ඉටුකිරීමට රු. 600,000 ක ප්‍රතිපාදන සලසා තිබුණි. එම කාර්යභාරය ඉටුකිරීමට යෝජිත කළමනාකරණ සහකාර නිලධාරීන් දීර්ඝ කාලයක සිට පුරප්පාඩුව පැවතුණු බැවින් අදාළ කටයුතු ඵලදායි ලෙස සිදුකර ගැනීමට නොහැකි වී තිබුණි. | 2021 වර්ෂයේ නව නිලධාරීන් බඳවා ගැනීමට හැකිවීම මත කටයුතු යාවත්කාලීනව ඉටු කරමින් පවතී. | සැලසුම්වලට අනුකූල විය යුතු වීම. |
| (xi) | ජල අංශයේ පවතින අවසාන පරිශීලක ගාස්තු පිළිබඳ සහනාධාර විශ්ලේෂණයක් සිදුකිරීමට සැලැසුම් කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වනවිට එහි ඉල්ලුම් කළමනාකරණ තිරුබඳු දිරිගැන්වීම් ව්‍යුහය සම්බන්ධ විශ්ලේෂණය කිරීමේ අදියර පමණක් නිම කර තිබුණි. | කොවිඩ් 19 වසංගත තත්ත්වය මත දත්ත ලබා ගැනීමට තිබෙන අපහසුතාව මත ජල අංශයේ පවතින අවසාන පරිශීලක ගාස්තු සහනාධාර විශ්ලේෂණයෙන් 60% ක පමණ ප්‍රමාණයක් නිම කිරීමට හැකි වී තිබුණි. | සැලසුම්වලට අනුකූල විය යුතු වීම. |
| (xii) | දැනටමත් නිකුත් කර ඇති පාරිභෝගික සේවා මාර්ගෝපදේශ වලට අනුකූල වීම යන කාර්යය සමාලෝචිත වර්ෂයේදී පළාත් 5 ක දැනුවත් කිරීමේ වැඩසටහන් යොදා ගනිමින් සිදුකිරීමට සැලැසුම් කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට එයින් පළාත් 2 ක වැඩසටහන් පමණක් ක්‍රියාත්මක කර තිබුණි. එය සමස්ථ කාර්යසාධනයෙන් සියයට 40 ක් පමණ වී තිබුණි. | කොවිඩ් 19 වසංගත තත්ත්වය මත රජය විසින් සෞඛ්‍ය හේතු මත මහජනයා ඒකරාශී කිරීම තහනම් කිරීම මත 2020 වර්ෂයේ මෙම දැනුවත් කිරීම් සිදු කිරීමට නොහැකි වී ඇත. 2021 වර්ෂය පහසුකම් ලබා දුන් මාස අනුව උතුරු මැද පළාත 2021 මාර්තු, මධ්‍ය පළාත 2021 නොවැම්බර්, බස්නාහිර පළාත 2021 දෙසැම්බර් නිමකර ඇත. | සැලසුම්වලට අනුකූල විය යුතු වීම. |
| (xiii) | භාවිතා කරන ලද ලිහිසි තෙල් එකතු කිරීම, ප්‍රතිචක්‍රීකරණය කිරීම සහ බැහැර කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම 2019 වර්ෂවලදී ආරම්භ කර තිබුණු අතර, ඒ සඳහා රු. මිලියන 3 ක ප්‍රතිපාදන සලසා තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එහි සැලකිය යුතු ප්‍රගතියක් වාර්තා වී නොතිබුණි. | අදාළ ක්‍රමවේදය ඇතුළත් වාර්තාව 2021 දෙවන කාර්තුව වන විට නිම කර ඇත. නමුත් කොවිඩ් 19 වසංගත තත්ත්වය මත මහජන උපදේශන පැවැත්වීමට අපහසු වී ඇති බැවින් එය ප්‍රසිද්ධ කිරීමට නොහැකි වී ඇත. | සැලසුම්වලට අනුකූල විය යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (xiv) | සී/ස ලංකා විදුලි (පෞද්ගලික) සමාගම (LECO) සමඟ විදුලිය (බෙදාහැරීමේ) කාර්යසාධන ප්‍රමිති රෙගුලාසි (වාණිජ තත්ත්වය) ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් කාර්යසාධනය ඇගයීම සඳහා ක්‍රියා පරිපාටි සම්බන්ධ රීති, අවශ්‍යතා සහ දර්ශක ස්ථාපිත කිරීම කොමිෂන් සභාවට පැවරී තිබුණි. එහි මූලික අදියර 2017 ඔක්තෝබර් මාසය වන විට අවසන් කිරීමට සැලැසුම් කර තිබුණු අතර දත්ත ලැබීම් ප්‍රමාදවීම හේතුවෙන් පළමු මාස දෙක සඳහා ඉදිරිපත් කරන ලද කාර්යසාධන ඇගයීමට අදාළ දත්ත සහ යෙදුම් මෘදුකාංග තවදුරටත් පරීක්ෂා කරමින් පැවතීම නිසා ඒ සම්බන්ධව ඵලදායී ප්‍රගතියක් වාර්තා වී නොතිබුණි. | 2021 වර්ෂයේ දී මෙහි තෙවන අදියර සඳහා ක්‍රියා පටිපාටිය රීති සහ දර්ශක ස්ථාපිත කිරීමට පියවර ගෙන ඇත . | සැලසුම්වලට අනුකූල විය යුතු වීම. |